පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492
දකුණු පළාත් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ආයතන භාර ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீடு வரிசை எண் – 492
தென் மாகாண சபை

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் தொடர்பான குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை 119(4) இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சரினால் மேற்கொள்ளப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Publication Serial No - 492
Southern Provincial Council

Presenting to the Parliament the observations and measures taken by the Honorable Minister in charge of Institutions under Standing Order No. 119(4) regarding the reports tabled by the Committee on Government Accounts of the Parliament.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : දකුණු පළාත් සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශනයන මාලා 492 හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
131-132	පලමු කොටස : 81.00	
	පළාත් සභාව සතු ඉඩම්,ගොඩනැගිලි,යන්ත්‍රෝපකරණ,ලී බඩු හා කාර්යාල උපකරණ හඳුනාගෙන අරමුදල් ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.	2023 වර්ෂයේ පළාත් සභාව සතු ඉඩම්, ගොඩනැඟිලි, යන්ත්‍රෝපකරණ, ලී බඩු හා කාර්යාල උපකරණ හා වාහන නියමිත පරිදි 2024.12.31 න් අවසන් වර්ෂය සඳහා පිළියෙළ කරන ලද පළාත් අරමුදල් ගිණුමෙහි සටහන් අංක 02 යටතේ දක්වා ඇති දේපළ, පිරියත හා උපකරණ සටහනෙහි ආරම්භක ශේෂයට ගැලපීම් සිදුකිරීම මහින් නිවරදි කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. ඒ අනුව 2023 වර්ෂයේ ගිණුම්ගත නොවූ ඉඩම් රු.55,590,000 ක්, ගොඩනැඟිලි රු.133,945,990 ක්, යන්ත්‍ර රු.1,035,068,293 ක්, මෝටර් රථ 18,524,992 ක්, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් රු.116,498,496 ක් 2024.12.31 න් අවසන් වර්ෂය සඳහා වන පළාත් අරමුදල් ගිණුමෙහි ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.
	අග්‍රිම ශේෂ වසරකට වඩා වැඩි කාලයකට රඳවා ගෙන තිබුණි.	<u>කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව රු.90,000</u> 2023 වර්ෂයේ පැවති Artisans's Gallery කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා ලබා ගත් තාවකාලික විදුලි සැපයුම් වෙනුවෙන් ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙත සිදු කරන ලද තැන්පතුවයි. ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් විදුලි පරිභෝජනය පිළිබඳ වාර්තාව 2023.12.31 දිනට පෙර ලබා දීම සිදු නොකර බැවින් 2023 වර්ෂයේදී ලබා ගන්නා ලද එම අත්තිකාරම් මුදල පියවීම සිදු නොකරන ලදී. නමුත් 2024 වර්ෂයේදී ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් ලබා දෙන ලද චෙක්පත් අංක 292355 හා 2024.01.16 දිනැති චෙක්පත මගින් 2024.01.29 දින (J 162305) අත්තිකාරම පියවීම සිදු කරන ලදී. <u>දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය රු.179,441.00</u> 2019 වර්ෂයේ නොපිය වී පැවති ඉන්ධන අත්තිකාරම වූ රු.74,616.00 මුදල ජනවාරි මස අය වී ඇති අතර , ඒ අනුව 2019 වර්ෂයේ නොපිය වූ අග්‍රිම ශේෂය නිරවුල් කිරීම සඳහා රු.74,616.00 වටිනා අංක 707534 හා 2026.01.31 දිනැති චෙක්පත එවා ඇත. 2019 වර්ෂයේ කරාපිටිය නාමල් ඉන්ධන පිරවුම්හල විසින් නොපියවූ ඉන්ධන අත්තිකාරම් මුදල 2025.10.10 දින පියවා ඇත.අංක 553053 දරණ 2025.11.24 දිනැති රු.104,825.00 ක් වටිනා චෙක්පත මේ සඳහා එවා ඇති බව කාරුණිකව සඳහන් කරමි.

වැඩිදුම සි. ලියාපදිංචි...
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

		<u>දකුණු පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව - රු.17,488,112.00</u> 2023.12.31 දිනට මාර්ගස්ථ ලෙස පැවති රු.17,488,112.00න් රු.688,927.00 ක් හැර ඉතිරිය 2024 ජනවාරි මස 10 දිනට පෙර පියවා ඇත.රු.688,927.00ක් වූ මුදල අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වූ සොරකම් හේතුවෙන් මෙතෙක් පියවා නොමැති අතර ගිවිසුම්ගත ආරක්ෂක ආයතනයෙන් සහ අදාළ නිලධාරීන්ගෙන් මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව වැඩි දුරටත් සඳහන් කර සිටිමි. <u>දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - රු.234,230,724</u> 2023.12.31 දිනට රු.234,230,724 ක ශේෂයක් සහිත නොපියවූ අග්‍රිම ශේෂය පහත පරිදි සැකසී ඇත. • ඔක්සිජන් බිල්පත් ප්‍රතිපූරණය 29,191,574.33 • රසායනික බිල්පත් ප්‍රතිපූරණය 194,483,104.24 • සීමාවාසික/පශ්වාත් සීමාවාසික 16,064.00 • වතු රෝහල් වෛද්‍ය නිලධාරී වැටුප් 2,999,837.00 • අධිකරණ වෛද්‍ය නිලධාරී වැටුප් 1,370,340.00 • වැඩසටහන් 335,044 • පළාත් සභාව මගින් ප්‍රතිපූරණය විය යුතු 5,834,760 2023.12.31 දිනට පැවති රු.234,230,724 ක ශේෂයක් සහිත නොපියවූ අග්‍රිම ශේෂය 2024.12.31 දින වන විට සම්පූර්ණ යෙන්ම නිරවුල් කර ඇත.

චන්දිම සී. මුහන්දිරාමගේ
ප්‍රධාන ලේඛාධිකාරී
දකුණු පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම්,ඉඩම් සංවර්ධන,මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492 හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
173	පළමු කොටස : 98.5	
	හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොගැනීම.	වර්තමානය වනවිට යාවත්කාලීන කර ඇත.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌණතා පිළිබඳව වන නිර්දේශද, අනෙකුත් නිර්දේශද නියමිත කාලවකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම.	2024 වර්ෂයේ සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අදාල නිර්දේශ ක්‍රියාත්මක කර අවසන් කර ඇත.
	වාහන අනතුරු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති අනුව කටයුතු නොකල අවස්ථා පැවතීම.	වර්තමානයේ පළාත් මුදල් රීති ප්‍රකාරව කටයුතු කර ඇත.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	පළාත් සභා ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අමාත්‍ය කාර්යමණ්ඩල ප්‍රතිපාදන ඉතිරිව පැවතීම සහ ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක 03/2021 අනුව වියදම් කළමණාකරණය කිරීම නිසා වැය විෂයන් කිහිපයකට අදාලව වියදම් ඇති නොවීම නිසා මුළු ප්‍රතිපාදනයන් ඉතිරි වීම. අනෙකුත් ප්‍රතිපාදන නිසි පරිදි කළමනාකරණය කර ඇත.
173	දෙවන කොටස : 91	
	තොරතුරු දැනගැනීමේ පනතට අනුව තම ආයතනයේ තොරතුරු ලබාදීම සඳහා නිශ්චිත නිලධාරියකු පත් කර නොතිබීම.	අමාත්‍යාංශ ලේකම් නම් කළ නිලධාරී ලෙස ද, සහකාර ලේකම්(පාලන) තොරතුරු නිලධාරී ලෙස ද වර්තමානයේදී කටයුතු කරනු ලබයි.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමට අදාලව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

.....
ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී

.....
ගණුන් දීමේ නිලධාරී

එච්.ජේ.ආර්. පතිරණ
පදිංචි
අධ්‍යාපන, ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
පානදුර පලාත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම්,ඉඩම් සංවර්ධන,මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492 හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
173	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ වීම.	2021 වර්ෂයේ සිට තත්වාගණනය කළ මතයක් ලැබී ඇත. පිරිසිදු මතයක් ලබාගැනීම සඳහා විගණකාධිපති විසින් පෙන්වා දී ඇති ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමටත්,ඉදිරියේදී එවැනි දෝෂ සිදු නොවීමටත්,අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

.....
ගණන් දීමේ නිලධාරී

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492
ආයතනය : දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
173	**පළමු කොටස 72.00**	
	තත්කාර්ය අතුරු අග්‍රිම (අත්තිකාරම්) නිසිපරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	2023 වර්ෂයට අදාළව ලබා ගන්නා ලද අතුරු අග්‍රිම ලේඛනයේ පියවීම් කිහිපයක් යාවත්කාලීනව සිදු කර නොතිබූ නමුත් සිගාස් වැඩසටහන යටතේ සියළුම අග්‍රිම පියවා අවසන් කර ඇත. නමුත් මේ වනවිට 2024 හා 2025 වර්ෂයන්ට අදාළව අත්තිකාරම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන අතර මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
	නිවාඩු ලේඛනය නිසිපරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.
	2004.5.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි	මේ වන විට අදාළ මුරපදය වෙනස් කර ඇති අතර මාස තුනකින් පසු නැවත මුරපදය වෙනස් කිරීමට කටයුතු කර ඇත
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය	විගණන විමසුම් සඳහා සම්පූර්ණ පිළිතුරක් සැපයීම සඳහා දෙපාර්තමේන්තුවේ අංශ හා කලාප අධ්‍යාපන කාර්යාල, කොට්ඨාස කාර්යාල හරහා පාසල් වෙතින්ද පිළිතුරු ගෙන්වා ගෙන පිළිතුරු සකස් කිරීම සිදු වීම හේතුවෙන් නියමිත දිනට පිළිතුරු සැපයීමට අපහසු වන අවස්ථාවල අතුරු පිළිතුරක් යොමු කිරීමට කටයුතු කර ඇත
	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි	ලොග් පොත් යාවත්කාලීන කර ඇත.
	වාහන අනතුරු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති අනුව කටයුතු නොකළ	පළාත් මූල්‍ය රීති අනුව කටයුතු කරනු ලබයි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

ගණන්දීමේ නිලධාරී

	අවස්ථා විය	
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි	2024 හා 2025 වර්ෂයන්ට අදාළ නිලධාරීන්ට අනුමත සීමාව තුළ පමණක් අග්‍රිම ලබා දීමට කටයුතු කර ඇත.
	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි	2026.06.15 දින වන විට කල් ඉකුත් වූ තැන්පතු නොමැත
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය	විගණන විමසුම් සඳහා සම්පූර්ණ පිළිතුරක් සැපයීම සඳහා දෙපාර්තමේන්තුවේ අංශ හා කලාප අධ්‍යාපන කාර්යාල, කොට්ඨාස කාර්යාල හරහා පාසල් වෙතින්ද පිළිතුරු ගෙන්වා ගෙන පිළිතුරු සකස් කිරීම සිදු වීම හේතුවෙන් නියමිත දිනට පිළිතුරු සැපයීමට අපහසු වන අවස්ථාවල අතුරු පිළිතුරක් යොමු කිරීමට කටයුතු කර ඇත
	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	2023 වර්ෂයේ වැය විෂයන් 08ක් යටතේ පමා වී ඉදිරිපත් කරන වවුවර්පත් සහ වර්ෂය අවසානයේ බැරකම්වලට වෙන් කරන ලද ප්‍රතිපාදන අවසන් වීම හේතුවෙන් ගෙවීමට නොහැකි වූ වවුවර්පත්වල අගය මෙසේ බැරකම් සඳහා ඉදිරිපත් කර ඇත. 2024 වර්ෂයේ මනා වියදම් කළමනාකරණයෙන් යුක්තව මෙම වැය විෂයයන් පාලනයකින් යුතුව මෙහෙයවන ලද අතර ඉදිරියේදී මෙම දෝෂ ඇති නොවීමට නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු සිදු කර ඇත.
	අදාළ අත්තිකාරම් කාර්ය සඳහා පළාත් සභාව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද නොතිබුණි	2024,2025 වර්ෂවලදී මෙම තත්වය ඇති නොවීමට කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

ගණන්දීමේ නිලධාරී

	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි	රා.පරි.ව.ලේ.01/2024 චක්‍රලේඛය අනුව හිඟ ණය ශේෂ පියවීමේ කටයුතු කරගෙන යන බව කාරුණිකව සඳහන් කරමි.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බදවාගෙන තිබුණි.	අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල ඌණ / අතිරික්තතා පිළිබඳ 2026 කාර්යය මණ්ඩල සමාලෝචන වාර්තාව 2026.03.31 දිනට යාවත්කාලීන කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අදාළ අනුමැතිය ලද පසු මෙම තත්ත්වය නිවැරදි වන බව කාරුණිකව පෙන්වා දෙමි.
174	දෙවන කොටස **91.00**	
	ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3.8.3 වගන්තියේ විධි විධාන පූර්ණ වශයෙන් ඉටු නොකර මාරු වීම් සම්බන්ධව කටයුතු කර ඇත.	මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන්නේ ගුරු සේවයේ ස්ථාන මාරු පමණක් වන අතර මේ වන විට ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3 ඡේදය පරිදි මාරු මණ්ඩල පත්කිරීමෙන් එම කටයුතු සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි.
	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි	මේ වන විට ලේඛනයක් පවත්වාගෙන යයි
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය	2023 වර්ෂය සඳහා තත්වාගණනය කළ විගණන මතයක් ලබා දී ඇති අතර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව ලබා දී ඇති විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩුපාඩු සකස් කර ගැනීමට අවධානය යොමු කර ඇති අතර, 2024 වර්ෂයේදී ඒ පිළිබඳ සැලකිල්ලට ගෙන එම වසරේ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඇත.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

ගණන්දීමේ නිලධාරී

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - දකුණු පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492 හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
174	පළමු කොටස	
	ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නැත.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. මෙම දෙපාර්තමේන්තුවට අයත් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක වල පිහිටි දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල, මූලික රෝහල් අටක් ඇතුළුව පළාත පුරා පිහිටා ඇති සෞඛ්‍ය ආයතන 278 ක වත්කම් ගණනය කොට දෙපාර්තමේන්තුව සඳහා ඒකාබද්ධ ස්ථාවර වත්කම් ලේඛනය සැකසිය යුතුව ඇත. ඒ අනුව ස්ථාවර වත්කම් වලින් 90%ක් පමණ මේවන විට නිවැරදිව ලේඛන ගතකර ඇති අතර ඉතිරි වත්කම් ප්‍රමාණය 2026 වසර අවසන්වීමට පෙර නිවැරදිව ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. ඇතැම් අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, ප්‍රාදේශීය රෝහල්, ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතන වැනි ප්‍රාදේශීයව විසිරී ඇති සෞඛ්‍ය ආයතනවලින් නිරීක්ෂණ හා තහවුරු කිරීමේ ලේඛන ගෙන්වා ගැනීමට සිදුවෙයි. මෙම ආයතන සහ පළාත් හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල අතර පවතින දුරස්ථ භාවය හේතුවෙන් ඇතැම් අවස්ථාවල පිළිතුරු ලබාදීමට මසකට වැඩි කාලයක් ගතවූ අවස්ථා පැවතිණි. මෙම අඩුපාඩු හැකිතාක් අවමකර ගැනීම සඳහා විවිධ ක්‍රමවේදයන් හඳුන්වාදී ඇති අතර මේ වන විට මෙම ප්‍රමාදය බොහෝදුරට මගහැරී ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

කේ. රසිකා එස්. ද සිල්වා
ලේකම් (රාජකාරී ආයාචනය)
ප්‍රධාන අමාත්‍යාංශ, නීතිය හා පාර්ලිමේන්තු සේවා හා ඉදිරිය වෛද්‍ය,
පළාත් පාලන, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය
5 වන මහල, දුරකථනාගාර ප්‍රධාන්‍යාංශ සංකීර්ණය,
කොළඹ 01, 00100.

.....

ගණන්දීමේ නිලධාරී

වෛද්‍ය එන්.පී.එස්.පණ්ඩිතරත්න
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දකුණු පළාත

	සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඒවායේ වාර්තා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පරිපාලන ව්‍යුහය සැකසී ඇති ආකාරය අනුව පළාත් අධ්‍යක්ෂ කාර්යාලය මගින් ආයතන 16 කද, ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් ආයතන 117කද, මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් ආයතන 82 කද, හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යලය මගින් ආයතන 63 කද භාණ්ඩ සමීක්ෂණ කටයුතු පැවැත්විය යුතුව ඇත. ඒ අනුව 2024.12.31 දිනට සමීක්ෂණ කටයුතු පැවැත්විය යුතු සියළු ආයතන වල භාණ්ඩ සමීක්ෂණ පවත්වා වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මකකර නොතිබුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පවත්වන ලද ගබඩා සමීක්ෂණ වාර්තා මගින් ලබාදී ඇති නිර්දේශ සියල්ල ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් කටයුතුකර ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. මෙම දෙපාර්තමේන්තුවට අයත් සියළු වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා නියමිත පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා මේ වනවිට කටයුතු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. මෙම දෙපාර්තමේන්තුවට අයත් සියළු වාහනවල ලොග් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යන බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	වාහන අනතුරු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති අනුව කටයුතු නොකල අවස්ථා විය.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. ඇතැම් වාහන අනතුරු සම්බන්ධව අධිකරණ ක්‍රියා මාර්ග වලට යොමු වීමට සිදුවීම, ඇතැම් අනතුරු වලට අදාල අලාභය රථයේ රියදුරුගෙන් වාරික වශයෙන් අයකිරීමට සිදුවීම වැනි හේතූන් මත අනතුරු සම්බන්ධව පළාත් මූල්‍ය රීති අනුව කටයුතු කිරීමට නොහැකි වූ අවස්ථා පවතින බව කාරුණිකව සඳහන් කරමි. ඉදිරියට මෙම තත්වය මගහරවා ගනිමින් පළාත් මූල්‍ය රීති වල විධි විධානයන්ට අනුව කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරන්නෙමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

කේ. රසිකා එස්. ද සිල්වා
ලේකම් (රාජකාර්ය භාවාරෝහය)
සුදාන අමාත්‍යාංශ, ඉඩම හා සංවර්ධන අමාත්‍යාංශය හා දේශීය සේවාලය,
පළාත් පාලන, පුවාහන සහ සංවර්ධන අමාත්‍යාංශයෙහි
ප්‍රධාන නිලධාරී, ප්‍රාදේශීයවාසය සංවර්ධන හා සංස්කෘතික,
ගාල්ල. 2025.2.7

.....

ගණන්දීමේ නිලධාරී

වෛද්‍ය එන්.ජී.එස්.පණ්ඩිතරත්න
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දකුණු පළාත

	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල්කර නොතිබුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතුව පැවති අංක 8253352 දරණ අක්‍රීය ජංගම ගිණුම 2023.10.06 වැනි දින වසා දමන ලද බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	අක්මුදල් සැසඳුම් ප්‍රකාශය අනුව අනාවරණයවී තිබුණු වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවරගෙන නොතිබුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයේ සිට මේ දක්වා අක්මුදල් සැසඳුම් ප්‍රකාශය වෙනස්කම් රහිතව ඉදිරිපත්කර ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. පොදු තැන්පත් ගිණුමේ තැන්පතු පළාත් සභා මූල්‍ය රීතිවල සඳහන් වීධි විධානයන්ට අනුව නියමිත කාලයට පෙර නිදහස් කිරීමට හෝ පළාත් ආදායමට බැර කිරීමට කටයුතුකර ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, ප්‍රාදේශීය රෝහල්, ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතන වැනි ප්‍රාදේශීයව විසිරී ඇති සෞඛ්‍ය ආයතනවලින් නිරීක්ෂණ හා තහවුරු කිරීමේ ලේඛන ගෙන්වා ගැනීමට සිදුවෙයි. මෙම ආයතන සහ පළාත් හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල අතර පවතින දුරස්ථ භාවය හේතුවෙන් ඇතැම් අවස්ථාවල පිළිතුරු ලබාදීමට මසකට වැඩි කාලයක් ගතවූ අවස්ථා පැවතිණි. මෙම අඩුපාඩු හැකිතාක් අවමකර ගැනීම සඳහා විවිධ ක්‍රමවේදයන් හඳුන්වාදී ඇති අතර මේ වන විට මෙම ප්‍රමාදය බොහෝදුරට මගහැරී ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනයකළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට ඵලඹ තිබුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. වර්ෂය සඳහා අවශ්‍යවන වියදම් ප්‍රමාණයට සරිලන පරිදි වාර්ෂික ඇස්තමේන්තු සකස් කරනු ලැබුවත්, ඉල්ලුම්කරනු ලබන ප්‍රතිපාදන 100%ක් නොලැබීම හේතුවෙන්, රෝගී සත්කාරක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වූ වියදම් දැරීමට සිදුවීමෙන් වර්ෂ අවසානයට ඉතිරිවූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට ඵලබීමට සිදුවූ අවස්ථා පැවතිණි. වියදම් කළමණාකරනය තුලින් මෙම තත්වය මේවන විට බොහෝදුරට මගහරවාගෙන ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

කේ. රසිකා එස්. ද සිල්වා
ලේකම් (රාජකාරී ආචරණය)
ප්‍රධාන අමාත්‍යාංශය, නීතිය හා පාර්ලිමේන්තු හා දේශීය වෛද්‍ය,
පළාත් සභාව, ත්‍රිකුණාමලය
දූ විස මණ්ඩල, ත්‍රිකුණාමලය

.....

ගණන්දීමේ නිලධාරී

වෛද්‍ය එන්.ජී.එස්.පණ්ඩිතරත්න
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දකුණු පළාත

	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ගත නිලධාරින්ට අමතරව දීප ව්‍යාප්ත සේවාවන් වල සහ දකුණු පළාත් සභා ඒකාබද්ධ සේවයට අයත් නිලධාරින් විශාල ප්‍රමාණයක් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබයි. මේ හේතුව මත පළාත් සභාව තුල වෙනත් ආයතනවලට සහ පළාත් සභාවෙන් පිට වෙනත් ආයතන වෙත නිලධාරීන් නිරන්තරයෙන් ස්ථාන මාරුවීම් ලබා පිටව යාම හේතුවෙන් සහ සෞඛ්‍ය කාර්ය සහායක සේවයේ පිරිස් නිරන්තර වැඩ තහනමට ලක්වීම හා සේවය හැරයාම හේතුවෙන්ද වසරකට වඩා වැඩි කාලයක සිට පවතින ණය ශේෂ ප්‍රමාණයක් පවතී. කෙසේ වෙතත් මේවන විට පැරණි ණය ශේෂ බොහෝ ප්‍රමාණයක් අයකර ගැනීම සඳහා කටයුතු කරගෙන ඇති බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
174	දෙවැනි කොටස	
	ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3.8.3 වගන්තියේ විධි විධාන පූර්ණ වශයෙන් ඉටු නොකර මාරුවීම් සම්බන්ධව කටයුතුකර ඇත.	ඇගයීම් නිරීක්ෂණ පිළිගනිමි. දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන කාර්ය මණ්ඩල සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය හා මෙම දෙපාර්තමේන්තුව යටතේ පත්කරනු ලබන මාරු මණ්ඩල මගින් සිදුකරනු ලබයි. සෑම වසරකම නියමිත සේවා කාලය සම්පූර්ණකර ඇති සියළු කාර්ය මණ්ඩලය ඒ ඒ මාරු මණ්ඩල සඳහා ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළත් මාරු මණ්ඩල මගින් ස්ථාන මාරු නියෝග ලබා නොදීම, මාරු මණ්ඩල නියෝග අභියාචනා මණ්ඩල විසින් අවලංගු කිරීම වැනි හේතූන් නිසා වසර 05ක සේවා කාලයක් ඉක්මවා ඇතම් නිලධාරින් එකම සේවා ස්ථානයක සේවය කරන අවස්ථා පවතී. මේ සම්බන්ධව මාරු මණ්ඩල දැනුවත්කර ආයතන සංග්‍රහයේ විධි විධාන වලට අනුව කටයුතු කිරීමට ඉදිරියේදී කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව සඳහන් කරන්නෙමු.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස්කරන ලද මූල්‍ය ප්‍රකාශනය විගණනය කිරීමෙන් අනතුරුව යටත්ව මට්ටමේ විගණන මතයක් ලබාදී ඇත. මෙම මතය සඳහා පාදකවූ අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව සඳහන් කරන්නෙමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

කේ. රසිකා එස්. ද සිල්වා
ලේකම් (රාජකාරී ආවරණය)
ප්‍රධාන අමාත්‍ය,නීතිය හා පාර්ලිමේන්තු කටයුතු හා දේශීය වෛද්‍ය සේවය. දකුණු පළාත, ප්‍රාදේශීය සභා සංවර්ධන අමාත්‍යාංශය
5 වන මහල, උස්බෙහෙත් ආයුර්වේද අමාත්‍යාංශ සංකීර්ණය,
මාලිඋව, කාර්ගු.

.....

ගණන්දීමේ නිලධාරී

වෛද්‍ය එච්.ජී.එස්.පණ්ඩිතාරත්න
දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492
ආයතනයේ නම : දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492 හි පිටු අංකය	කමිටුව විසින් හඳුනා ගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
174	පළමු කොටස 89.00	
	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023.12.31 දිනට පැවති වසර 02 ඉක්මවූ තැන්පත් මේ වන විට නිරවුල් කර ඇත.
	ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	2023 වර්ෂය සඳහා වාර්ෂික අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු හා මුදල් රීති 30 අනුව ප්‍රතිපාදන මාරු කර ගැනීමද ඇතුළත්ව 2023 වර්ෂය සඳහා සලසා ගන්නා ලද ශුද්ධ ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දරා ඇති බව කාරුණිකව දන්වමි.
	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	2023 වර්ෂයේ රටෙහි පැවති ආර්ථික අස්ථායිතාවය හා අනපේක්ෂිත උද්ධමනය හේතුවෙන් බොහෝ වැය විෂයන් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමානවත් නොවුනි. ඉදිරියේදී නිවැරදි ඇස්තමේන්තු සකස් කරමින් වියදම් කලමනාකරණය කිරීමට උපරිම උත්සහයක් දරන බව කාරුණිකව සඳහන් කරමි.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	රාජ්‍ය වියදම් කළමනාකරණ ප්‍රතිපත්ති තුළ 2023 වර්ෂයේ පුනරාවර්තන වියදම් හා අත්‍යවශ්‍ය ප්‍රාග්ධන වියදම් පමණක් සිදුකරන ලෙස දිගින් දිගටම වක්‍රලේඛ මගින් උපදෙස් ලැබූ හෙයින් ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කර ගත්තද ඒවා පසුවට කල් තැබීම මත 2106 හා 2505 වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරිව ඇත. තවද කල්බදු පදනම මත වාහන ලබා ගැනීම නැවත දන්වන තුරු නතර කර ඇති හෙයින් 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන්කර ගත්තද එම වැය විෂයෙන් වියදම් දරා නොමැත.

ඉංජි. කේ. කේ. සමන්සිලක
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය
කෝට්ටේ - ගාල්ල.

	රැස් කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබිණි.	දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් දකුණු පළාත් සභාවෙන් පරිභාහිරව සිදු කරන කර්මාන්ත වෙනුවෙන් පරිපාලන වියදම් වශයෙන් ලැබෙන මුදල් පොදු තැන්පත් ගිණුමට බැර කර අදාළ ව්‍යාපෘති වල රාජකාරි කටයුතු වල නිරත වන නිලධාරීන් වෙනුවෙන් ගමන් වියදම්,අතිකාල ලිපි ද්‍රව්‍ය හා ඉන්ධන වියදම් දරා ඇත. විගණනයෙන් කරන ලද පෙන්වා දීම් අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් ඇමතූ SPES/2/1/3(1) අංක හා 2024.06.20 දිනැති ලිපිය මගින් (ඇමුණුම - 03) මෙම ක්‍රමවේදය සම්බන්ධව විමසීම් කර ඇති අතර, දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2024.07.18 දිනැති CSS/7/1/17 අංක දරන ලිපිය මගින් මේ සම්බන්ධව මුදල් රීති 429 අනුව කටයුතු කරන ලෙස දැනුම් දී ඇත.ඒ අනුව 2024.07.18 දින සිට පරිපාලන වියදම් ලෙස ලැබෙන සියලුම ලැබීම් වලින් 10% ක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
175	දෙවැනි කොටස: 84.00	
	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අලුතෙන් සකස් කර ඇති වෙබ් පිටුවෙහි මේ සඳහා පහසුකම් සහිතව සකස් කර ඇත.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වෙනුවෙන් තත්වාගණනය කළ මතයන් විගණනය විසින් ලබා දී ඇත.ඉදිරි වර්ෂ වලදී මූල්‍ය ප්‍රකාශන වෙනුවෙන් තත්වාගණනය නොකළ මතයක් ලබා ගැනීම උදෙසා කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

ඉංජි. කේ. කේ. සමන්තිලක
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය
කෝට්ටේ - තාල්ල.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනය : දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492 හි පිටු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග /වර්තමාන තත්වය
175	පළමු කොටස . 96	
	ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබීම.	2025.12.31 දින වන විට පළාත් අධ්‍යක්ෂක කාර්යාලය, සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය හා රජයේ සත්ත්ව ගොවිපලෙහි සූර්ය බලශක්ති කට්ටල දේපල පිරියත උපකරණ වටිනාකම් විද්‍යුත් උපකරණ යටතේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි.
	ඇතැම් වැය විෂයයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය වීම.	312-3-2-0-2505 - 500,000.00 අපේක්ෂිත අයුරින් වියදම් සිදු නොවීම මත ඇස්තමේන්තු කල ප්‍රතිපාදන ඉතිරි වූ බව කාරුණිකව දැනුම් දෙමි. 312-3-2-0-2507 - 500,000.00 අපේක්ෂිත අයුරින් වියදම් සිදු නොවීම මත ඇස්තමේන්තු කල ප්‍රතිපාදන ඉතිරි වූ බව කාරුණිකව දැනුම් දෙමි. 312-45-2-0-1703 - 200,000.00 අපේක්ෂිත අයුරින් වියදම් සිදු නොවීම මත ඇස්තමේන්තු කල ප්‍රතිපාදන ඉතිරි වූ බව කාරුණිකව දැනුම් දෙමි.
	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය බඳවා ගෙන තිබීම.	2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන් අතිරික්තයක් පෙන්නුම් කලද 2023 වර්ෂයෙන් පසුව කාර්යය මණ්ඩල සමාලෝචනයක් සිදු නොවීය. සේවා අවශ්‍යතාවය මත මෙම අතිරික්ත නිලධාරීන් දෙපාර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කර ගැනීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය සඳහා යොමුකර ඇති අතර ඉදිරියේදී පැවැත්වීමට නියමිත කාර්යය මණ්ඩල සමාලෝචනයේ දී මේ පිළිබඳව සලකා බලන බව දන්වා ඇත.
175	දෙවැනි කොටස -82	

ආචාර්ය ඒ. යෝ. පී. සුලෝචනා පියාසේ
අතිරේක පළාත් අධ්‍යක්ෂ
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු
මාතර.

	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොකිබීම.	2023 වර්ෂයේ වේබ් අඩවියක් සකස් කර නැත. 2024 වර්ෂයේ වෙබ් අඩවියක් සකස් කර ඇත. එම වේබ් අඩවි ලිපිනය https://daph.sp.gov.lk වේ.
	ආයතනය පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථා සලසා දී නොකිබීම.	2024 වර්ෂයේ සකස් කරන ලද වෙබ් අඩවිය මගින් our services මඟින් තොරතුරු පනතට අදාලව තොරතුරු ලබා ගැනීමට RTT.01. පෝමරය download කර ගැනීමට පහසුකම් සලසා ඇත. වේබ් අඩවියේ contact යටතේ සියලුම අධ්‍යක්ෂවරුන් හා ගණකාධිකාරිගේ ෆැක්ස් අංක, දුරකථන අංක, විද්‍යුත් තැපැල් ලිපිනයන් දක්වා ඇත. එමඟින් පැමිණිලි හා ප්‍රශංසා ඉදිරිපත් කල හැකි බව කාරුණිකව දන්වමි.

ඒ.කේ.ජී.එස්. ජිනසේන
පළාත් අධ්‍යක්ෂ/දකුණ (වැ.බ)

වෛද්‍ය ඒ. කේ. පී. සුලෝචනා පීනසේන
අතිරේක පළාත් අධ්‍යක්ෂ
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු
මාතර.

රංචිත් යාපා
ලේකම්
පිටත. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය
පරිසර සංරක්ෂණ, ග්‍රාමීය කර්මාන්ත, වැඩිමහල් සහ
ග්‍රාමීය හා වනු ජාතික පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය
දකුණු පළාත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම - කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492 හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග /වර්තමාන තත්වය
260	පළමු කොටස : 85	
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය	විගණන විමසුම් ලද විගස අදාල ආයතන වෙත කඩිනමින් යොමුකර පිළිතුරු මාර්ගගත ක්‍රම හරහා ලබා ගනිමින් සහ පැවති අභ්‍යන්තර ගැටළු නිරාකරණය කර ගනිමින් මසක් ගත වීමට ප්‍රථම පිළිතුරු සැපයීමට කටයුතු සම්පාදනය කර ඇත.
	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලද ලිපි සන්තකයේ නොමැත	මේ වන විට ආයතනය සතුව පවතින වාහන සියල්ල (15) සඳහා අයිතිය තහවුරු කරන සියලුම ලිපිලේඛන ආයතනය සතුව පවතියි.
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට මසකට වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය	විගණන විමසුම් ලද විගස අදාල ආයතන වෙත කඩිනමින් යොමුකර පිළිතුරු මාර්ගගත ක්‍රම හරහා ලබා ගනිමින් සහ පැවති අභ්‍යන්තර ගැටළු නිරාකරණය කර ගනිමින් මසක් ගත වීමට ප්‍රථම පිළිතුරු සැපයීමට කටයුතු සම්පාදනය කර ඇත.
	මු.රෙ 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි	දෙපාර්තමේන්තුව ඇතුළු සියලුම උප කාර්යාල වෙත අදාල මුදල් වර්ෂය සඳහා වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාව තුළ වියදම් කළමනාකරණය කර ගැනීමට උපදෙස් ලබා දී ඇති අතර ප්‍රතිපාදන හිඟ වේ යැයි අපේක්ෂා කරන ඇතැම් වැය විෂයන් සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද මගින් වියදම් සීමා කිරීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන ලදි. 2025 වර්ෂය සඳහා සියලු වියදම් කළමනාකරණය කර ගනිමින් ඉතිරි ප්‍රතිපාදන සීමාවට යටත්ව වැය විෂයන් කිහපයක් සඳහා පමණක් බැරකම් වලට එළඹ ඇත.

කේ.කේ.ජී.ඒ.ශෂිකලා
පළාත් අධ්‍යක්ෂ (කර්මාන්ත)
දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

රංජිත් යාපා
ලේකම්
ධීවර අමාත්‍යාංශය
දකුණු පළාත

	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය	අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සියලුම ආයතන මගින් නිවැරදි හා තාත්වික දත්ත ලබාගෙන අවශ්‍යතා හඳුනාගනිමින් ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගන්නා ලදි.
	වසරකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අවු. 45 ට වැඩි පත්වීම් ලාභී විශ්‍රාමික නිලධාරීන් 03 දෙනෙකුගෙන් අය වීමට පැවති රු. 128,065.00 ක් වන ණය ශේෂයෙන් ප්‍රධාන ලේකම් වක්‍රලේඛ (මුදල්) 01/2024 ප්‍රකාරව රු. 68,522.00 ක ප්‍රමාණය කපා හැර ඇති අතර ඉතිරි රු. 59,543.00 ක මුදල අදාල නිලධාරියාගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් මෙතෙක් තීරණයක් ලැබී නොමැති බැවින් ඉතිරිව පවතී. විශ්‍රාමික නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවීමට පැවති රු. 876,391.85 ක මුදල අයකර අවසන් කර ඇත. රු. 34,322.00 ක ශේෂයක් පවතින නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප මෙතෙක් හිමිව නැත. රු. 145,447.00 ක ණය ශේෂයක් පවතින නිලධාරියෙකුගේ මරණ පාරිතෝෂිකය මෙතෙක් හිමිව නැත. රු. 50,155.00ක ණය ශේෂයක් පවතින නිලධාරියෙකුගේ ණය ශේෂ විශ්‍රාම වැටුප් පද්ධතියට ඇතුල් කිරීමේදී මතුවූ දෝශයක් හේතුවෙන් අය වී නැති අතර ඒ මුදල අයකිරීම සම්බන්ධව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. රු. 69,624.00 ක ණය ශේෂ පැවති නිලධාරියා මේ වන විට මාසිකව වාරික වශයෙන් ණය ශේෂය ගෙවීම සිදු කරන අතර 2026.05.31 දිනය ශේෂය රු. 48,624.00 කි. රු. 24,467.11 ක් වන සේවය හැගිය නිලධාරියෙකුගේ ණය ශේෂ සම්පූර්ණයෙන් අයකර ඇත.
260	දෙවන කොටස : 94	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටමේ/ව්‍යවන මට්ටමේ / අහිතකර මට්ටමේ පැවතිනි	යටත්ව මට්ටමේ මතයකි. විගණනය මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගනිමින් තවදුරටත් එවැනි දෝෂ සිදු නොවීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත.

කේ.කේ.පී.ඒ.ශෂීකලා
පළාත් අධ්‍යක්ෂ (කර්මාන්ත)
දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

රංජිත් යාපා
ලේකම්
ධීවර අමාත්‍යාංශය
දකුණු පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492හි පිටු අංකය	කමිටුව විසින් හඳුනා ගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතන විසින්ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
190	පළමු කොටස : 84.00	
	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2023, 2024, 2025, 2026 වර්ෂවලට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති අතර, එහි පිටපත් දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලයට හා ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති වෙත යොමු කර ඇති බවද කාරුණිකව සඳහන් කරමි.
	සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඒවායේ වාර්තා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2025 දෙසැම්බර් 15 දින වන විට සමීක්ෂණ මණ්ඩල පත් කර මෙම අමාත්‍යාංශයට අයත් ආයතන වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාලරාමුව අනුව අවසන් කර පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	පළාත් මූල්‍ය නීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 14 ක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	අතුරු අග්‍රිම දින 14 ක් ඇතුලත නිරවුල් කරන ලෙස අදාල නිලධාරීන් ලිඛිතවම දැනුවත් කර මේ වන විට නියමිත දින 14 ඇතුලත අතුරු අග්‍රිම නිරවුල් කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.
	විගණන විමසුම් සඳහා පිළිතුරු පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	මෙම අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු කිහිපයකින් මෙන්ම භාහිර රාජ්‍ය ආයතන වෙතින්ද තොරතුරු ලබා පිළිතුරු සකස් කළ යුතු විගණන විමසුම් කිහිපයක් පමණක් මෙසේ ප්‍රමාද වීම් සිදුවූ අතර, විගණන විමසුම සඳහා පිළිතුරු ලබා ගැනීමට එම ආයතන වෙත යොමු කිරීමෙන් පසුවද පසුවිපරම් සිදුකරමින්, ලිඛිත සිහි කැඳවීම් ලබා දෙමින් මෙම තත්වය අවම කර ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන් දෙමි.
	ඇතැම් වැය විෂයයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	2019 අප්‍රේල් මස පළාත් සභා විසුරුවා හැරීම නිසා අමාත්‍ය කාර්යය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වන අතර, පළාත් සභා පිහිටුවීමෙන් පසු එම තත්වය මග හැරී යන බව කාරුණිකව සඳහන් කරමි.

	අදාළ අත්තිකාරම් කාර්යය සඳහා පළාත් සභාව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද නොතිබුණි.	එක් නිලධාරියකු වෙත ලබා දෙන අත්තිකාරම් මුදල් සීමාව වැඩි කර අනුමත කර ගැනීම සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉල්ලුම් කිරීමෙන් අනතුරුව ප්‍රධාන ලේකම්ගේ අංක CSS/7/17 හා 2026.04.29 දිනැති ලිපියෙන් දිස්ත්‍රික්, පළාත් හා ජාතික ක්‍රීඩා දිනය සැමරීම, රාජ්‍ය සේවා ක්‍රීඩා සංවිධානය කිරීම, ක්‍රීඩා සංචිත පැවැත්වීම සහ පුහුණු කඳවුරු පැවැත්වීම වෙනුවෙන් මාණ්ඩලික නිලධාරියකුට ලබා ගත හැකි "තත්කාර්ය" අතුරු අග්‍රිම සීමාව මූල්‍ය රීති 261.2.2 ප්‍රකාරව රු.250,000.00 දක්වා ඉහළ නැංවීමට අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.	2011 අගෝස්තු 22 දින විශ්‍රාම ගොස් ඇති කාර්යාල කාර්යය සහායක අයි.ඩී. නෙල්සන් මහතා විශ්‍රාම ගැනීමට අදාල ලිපි ලේඛණ භාර නොදීම හේතුවෙන් විශ්‍රාම වැටුප් සකස් නොවීම මත විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කිරීමට නොහැකි වී ඇත. එම ණය මුදල අය කරගැනීමට අදාළ සියලු කටයුතු සිදුකිරීමෙන් අනතුරුව ගාල්ල දිසා අධිකරණයේ නඩු අංක M/12413 යටතේ නඩු පවරා ඇතත් අදාළ නිලධාරියා විසින් අධිකරණයේදී වාරික වශයෙන් ගෙවීමට එකඟ වී තිබූ අතර ගිවිසුම සම්පූර්ණයෙන්ම පැහැර හැරීම නිසා මේ වන විට ඉදිරි ක්‍රියාමාර්ග ලෙස ඇක්සිසි නියෝග ක්‍රියාත්මක කිරීමට ගොනු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
190	දෙවැනි කොටස: 95.00	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	2025.12.31 දිනට මෙම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව විගණන මත ඉදිරිපත් කර ඇති ආකාරය පහත දැක්වේ. • ක්‍රීඩා අරමුදලේ මූල්‍ය ප්‍රකාශය සඳහා සත්‍ය හා සාධාරණ මතය • ග්‍රාම සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශය සඳහා තත්වාගණනය කළ මතය • සංස්කෘතික සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශය සඳහා තත්වාගණනය කළ මතය • අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශය සඳහා තත්වාගණනය කළ මතය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත.

පාර්ලිමේන්තු ප්‍රකාශයන මාලා 492හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
176	පළමු කොටස :91	
	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි	බැංකු සැසඳුම්වලින් අනාවරණය වූ ශේෂ මු.රෙ. ප්‍රකාරව නිරවුල් කර ඇති අතර ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
	පළාත් මුලා රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	තත්කාර්ය අතුරු අග්‍රිම දින 14ක් තුළ පියවන ලෙස මාණ්ඩලික නිලධාරි සාකච්ඡාවේදී ප්‍රධාන ලේකම් විසින් නිලධාරින්ව දැනුවත් කිරීම සිදු කර ඇති අතර මේ වන විට ප්‍රමාදයකින් තොරව අග්‍රිම පියවීමේ කටයුතු සිදු වන බව කාරුණිකව දන්වා සිටිමි.
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය	මෙවැනි ප්‍රමාදයන් වළක්වා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.
176	දෙවන කොටස : 90	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම පිළිබඳ වූ මතය තත්ත්වාගණනය කළ මතයක් විය. ඉදිරියේදී පිරිසිදු විගණන මතයක් ලබා ගැනීම සඳහා කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.
	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	2025 වර්ෂයේ දී නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

වන්දන සී. මුනසිංහගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : 492

ආයතනයේ නම: පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492 පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන් ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන ප්‍රගතිය
පිටු අංක 177	පළමු කොටස :87.00	
	හානි පිළිබඳ ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	මේ වන විට හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලබයි.
	මසක් තුළ අභ්‍යන්තර විගණන වීමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	සහකාර පළාත් පාලන කොමසාරිස්වරු වෙත සෘජුව වහකිම පවරා දීම තුළින් ඉතාම කඩිනමින් විද්‍යුත් තැපෑල ඔස්සේ පිළිතුරු ගෙන්වා ගැනීම නිසා වර්තමානය වන විට නියමිත කාලය තුළ විගණන වීමසුම් සඳහා පිළිතුරු සැපයීම සිදු කරනු ලබයි.
	වාහන අනතුරු සම්බන්ධයෙන් පළාත් මුල්‍ය රීති අනුව කටයුතු නොකළ අවස්ථා විය	ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු නිර්දේශයන්ගෙන් තොරව, හුදෙක් ඉංජිනේරු නිර්දේශ මත හදිසි තීරණ නොගැනීමටත්, රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ දැඩිව අනුගමනය කිරීමටත් සියලුම සහකාර කොමසාරිස්වරුන් සහ විෂය භාර නිලධාරීන් ලිඛිතව දැනුවත් කර ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් මේ වන විට දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇත.
	විගණන වීමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල වෙත සෘජුවම වගකීම පවරමින්, විගණන පිළිතුරු කඩිනම් කිරීම සඳහා විද්‍යුත් තැපෑල (E-mail) මඟින් වහාම තොරතුරු කැඳවීමටත්, මෙම කටයුතුවලට ඉහළම ප්‍රමුඛතාවය දී සති දෙකක් ඇතුළත ප්‍රතිචාර නොලැබුණහොත් දුරකථනයෙන් පසු විපරම් කිරීමටත් පියවර ගෙන ඇති බැවින්, මින් ඉදිරියට නියමිත කාලසීමාව තුළ විගණන වීමසුම්වලට පිළිතුරු සැපයීමට උපරිමයෙන් කටයුතු කරනු ලැබේ.
	අනුමත සිමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	2023 වර්ෂයට අදාලව අනුමත සීමාව ඉක්මවා සිදු කර ඇති කාර්ය මාණ්ඩල බඳවා ගැනීම් නිවැරදි කර ඇත.
පිටු අංක 177	දෙවැනි කොටස: 95.00	
	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

ගණන් දීමේ නිලධාරී
පළාත් පාලන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
ප්‍රධාන අමාත්‍යාංශය
දකුණු පළාත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492
ආයතනයේ නම : දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු මගහරවා ගැනීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග/ වර්තමාන තත්වය
177	**පළමු කොටස: 95.00**	
	වාර්ෂික කාර්ය සාධන වාර්තාව නිසි පරිදි පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	2024 සහ 2025 වර්ෂ වලදී නිසි පරිදි වාර්තා ඉදිරිපත් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
177	**දෙවැනි කොටස: 89.00**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2024 සහ 2025 වර්ෂ සඳහා තත්වාගණනය කළ මතයක් විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.

ගණන්දීමේ නිලධාරී,
ආයුර්වේද කොමසාරිස්,
දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව,
දකුණු පළාත

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය,
දකුණු පළාත
කේ. රසිකා එස්. ද සිල්වා
ලේකම් (රාජකාරී ආවරණය)
ප්‍රධාන අමාත්‍ය,සිසිල ගා සාමය,සෞඛ්‍ය හා වැඩිහිටි වෙවුල,
පළාත් පාලන, ප්‍රවාහන සහ සංචාරක අමාත්‍යාංශය
5 වන මහල, දක්ෂිණාපාය අමාත්‍යාංශ සංකීර්ණය,
ගුඩුදුව, ගාල්ල.

පාර්ලිමේන්තු ප්‍රකාශන ප්‍රශ්න මාලා අංක : 492

ආයතනයේ නම : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දකුණු පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492 හි පිටු අංක	කමිටුව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩු	දුර්වලතා මඟහරවා ගෙන ඇති පියවර/වර්තමාන තත්වය
177	**පළමු කොටස: 89.00**	
	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුනි.	2023 වර්ෂයේ පොදු තැන්පත් ගිණුමෙහි කල් ඉකුත් වූ තැන්පත් නොතිබුනි.
	ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	2023 වර්ෂයේ වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා නොතිබුණි
	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	මු.රෙ.94 (1) ප්‍රකාරව වර්ෂ අවසාන ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ නොතිබුණි.
177-178	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	රාජයේ මූලධන වියදම් සීමා කිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා කාර්යාලීය උපකරණ වලට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම මත එහි වෙන් කල ප්‍රතිපාදනය ඉතිරි විය.
178	රැස් කර තිබූණු ආදායම් සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුලත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි.	2023 වර්ෂයේ එවැනි තැන්පත් නොතිබුණි.
178	**දෙවන කොටස: 95.00**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ අවසාන ගිණුම් සඳහා යටත්ව මට්ටමේ මතයක් ලැබී ඇති අතර ඉදිරියේදී තත්වාගණනය නොකළ මතයක් ලබා ගැනීම සඳහා කටයුතු කරමි.

මහාමඩිතා
ප්‍රධාන ගිණුම් පුධිකාරී කොමසාරිස්
ගිණුම් පරීක්ෂණ සේවා පුධිකාරී දෙපාර්තමේන්තුව
ඉල. 306/72, බුද්ධාලෝක මාවත, කොළඹ 07

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : අංක 492

ආයතනයේ නම : දකුණු පළාත් සභා ලේකම් කාර්යාලය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492 හි පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්වය
178	පළමු කොටස : 96	
